# RECONDITIONED මෝටර් රථ + STERLING WARRANTY වැඩි ඉල්ලුමක් සහ නැවත අලෙවියේදී හොඳම මිලක්

> Sterling Aftercare Guarantee වගකීම් සහතිකය යටතේ මෙරටට ආනයනික මෝටර් රථවලට අලෙවියෙන් පසු සේවා ලබා දීම සඳහාම වෙන්වූ නවීන සේවා මධ්‍යස්ථාන හයක් Sterling Aftercare Centre නමින් නුගේගොඩ, කඩවත, නාරාහේන්පිට, රත්මලාන, මිනුවන්ගොඩ සහ ගාල්ල යන නගරවල පිහිටා තිබෙනවා. මෝටර් රථ සඳහා වගකීම් සහතිකයක් සහිතව තමන් විසින්ම පවත්වාගෙන යන සේවා මධ්‍යස්ථාන තිබෙන ශ්‍රී ලංකාවේ එකම ආයතනය ස්ටර්ලින් ජැපෑන් සමාගමට අනුබද්ධිත ස්ටර්ලින් ඔටෝමොබයිල්ස් ලංකා (පුද්.) සමාගමයි.




තමන්ගේම කියා මෝටර් රථයක සාඩම්බර හිමිකරුවෙකු වීම බොහෝ දෙනාගේ ජීවිතවල ඉලක්කයක් මෙන්ම වැදගත් සන්ධිස්ථානයක්. තමන්ගේ ගමන් බිමන් ඉතා පහසුවෙන් තමන්ට කැමති පරිදි ප්‍රමාදයන්ගෙන් තොරව සිදුකර ගැනීමේ අවස්ථාව සලසා ගැනීමට බොහෝදෙනා මෝටර් රථ මිලදී ගැනීමට උනන්දුවෙනවා. දිනෙන් දින නිපදවන නව මෝටර් රථ මාදිලි ප්‍රමාණයේ සීඝ්‍ර වර්ධනයත් සමඟින් බොහෝ දෙනා එක් රථයක් අවුරුදු 3-5 අතර කාලයක් පාවිච්චි කර ඉන් අනතුරුව එය නැවත අලෙවි කර අලුත් වාහනයක් මිලදී ගැනීමට නැඹුරුවක් දක්වනවා. එමනිසා සැලකිය යුතු මූල්‍ය ආයෝජනයක් කරමින් ඔබ හිමි කරගන්නා රථය තත්ත්වයෙන් උසස් සහ නවීන උපාංග සහිත වීම මෙන්ම නැවත අලෙවි කිරීමේදී වටිනාකමකින් යුක්ත වීම වැදගත්.

■ **නඩත්තුව පහසු මෝටර් රථ**

යම් යම් අවස්ථාවලදී මෝටර් රථයක විකුණුම් මිල සාපේක්ෂව අඩු අගයක් ගන්නා නමුත් එවැනි රථ නඩත්තු කිරීමේදී ඉතා වැඩි පිරිවැයක් දැරීමට සිදුවෙනවා. උදාහරණයක් ලෙස කොරියාවෙන් සහ ඉන්දියාවෙන් මෙරටට ආනයනිත ඇතැම් වාහනවල අමතර කොටස් සහ උපාංග මිල අධික වෙනවා. එම නිසා එවැනි වාහන මිලදී ගැනීමේදී ඔබ දැරිය යුතු මූලික වියදම අඩු වුවත්, පසු කාලීනව ඔබට එම රථය නඩත්තු කිරීමට වැඩි වියදමක් දැරීමට සිදුවෙනවා.

■ **නැවත අලෙවි කිරීමේදී වටිනාකම වැඩි මෝටර් රථ**

අප රටෙහි වැඩිම ඉල්ලුමක් පවතින්නේ ජපානයේ පාවිච්චිය සඳහා නිෂ්පාදිත (Japanese Domestic Model - JDM) මෝටර් රථ සඳහායි. මීට හේතුව වන්නේ JDM රථ ඉන්දියාවේ නිෂ්පාදිත රථවලට වඩා තත්ත්වයෙන් උසස්වීම සහ යුරෝපීය මෝටර් රථවලට වඩා මිලෙන් අඩු වීමයි. එම නිසා පාවිච්චි කරන ලද JDM වාහන සඳහා ඉතා හොඳ වෙළඳපොළක් නිර්මාණය වී තිබෙනවා. උදාහරණයක් වශයෙන් අදවන විට අලුත් 800CC ඉන්දියන් ඇල්ටෝ රථයක් රුපියල් ලක්ෂ 27.7ක පමණ මුදලකට අලෙවි වෙද්දී, 2015 නිෂ්පාදිත එම මාදිලියේ පාවිච්චි කරන ලද රථ අලෙවි වන්නේ ලක්ෂ 17-18 අතර මුදලකටයි. ඒ කියන්නේ වර්තමානයේ අලෙවි වන මිල මෙන් 33% අඩුවීමක්. පාවිච්චි කරන ලද ඉන්දියාවේ හා කොරියාවේ නිෂ්පාදිත මෝටර් රථ සඳහා නැවත අලෙවි කිරීමේ දී අඩු වෙළඳපොළ වටිනාකමක් හිමිවන නිසා එවැනි රථයකට ඔබ මූලිකව ආයෝජනය කළ මුදල ඔබට නැවත අයකර ගැනීමට නොහැකිවෙනවා. එමනිසා හැකිතාක් කල් එම වාහනයම පාවිච්චි කිරීමට ඔබට සිදු වෙනවා.

තත්ත්වයෙන් උසස් වීම, නඩත්තු කිරීම පහසුවීම සහ නියම අමතර කොටස් සහ උපාංග සුලබව තිබීම යනාදී කාරණා හේතුකොටගෙන ලියාපදිංචි කරන ලද JDM රථ සඳහා වෙළඳපොළේ ඉතා හොඳ ඉල්ලුමක් පවතිනවා.

ජපානයේ නිෂ්පාදිත ලියාපදිංචි නොකළ JDM ඇල්ටෝ රථ ලක්ෂ 26-27 අතර මුදලකට අලෙවි වන අතර 2015 නිෂ්පාදිත එම මාදිලියේම ලියාපදිංචි කළ රථ අලෙවි වන්නේ ලක්ෂ 21-22 අතර මුදලකටයි. එනම් 2019 නිෂ්පාදිත ජපන් ඇල්ටෝ රථයකට සාපේක්ෂව 2015 නිෂ්පාදිත ඇල්ටෝ රථයක ඇත්තේ 18% අගය අඩු වීමක් පමණයි. එමෙන්ම 2018 නිෂ්පාදිත ලියාපදිංචි නොකළ JDM ටොයෝටා විට්ස් රථයක වර්තමාන වෙළඳපොළ වටිනාකම රුපියල් ලක්ෂ 40-43 වන අතර, එම රථයේම 2017 නිෂ්පාදිත ලියාපදිංචි කරන ලද මාදිලි ලක්ෂ 35-38 අතර මුදලකට අලෙවි වෙනවා.

■ **Sterling Aftercare Guarantee වගකීම් සහතිකයත් සමඟ මෝටර් රථයක් මිලදී ගත යුත්තේ ඇයි?**


ස්ටර්ලින් ජැපෑන් සමාගම විසින් Sterling Aftercare Guarantee වගකීම් සහතිකය හඳුන්වාදෙනු ලබන්නේ ජපානයෙන් ආනයනිත මෝටර් රථ සඳහා කිසිඳු වගකීම් සහතිකයක් හෝ වගකිවයුතු පාර්ශ්වයක් නොතිබූ අවධියකයි. මේ හරහා පාරිභෝගිකයන්හට බියක් සැකක් නොමැතිව ඕනෑම ජපන් රථයක් මිලදී ගැනීමට වාතාවරණයක් සකස් වුණා.

වගකීම් කාලය ඇතුළතදී රථය පහසුවෙන් නඩත්තු කරගැනීමට උපකාරී වනු පිණිස වැඩකුලී ගාස්තු නොමැති සේවා වාර (Labour Free Full Service), පාරිභෝගිකයින් හට ලබා දෙනවා.

Sterling Aftercare Guarantee වගකීම් සහතිකය යටතේ මෙරටට ආනයනික මෝටර් රථවලට අලෙවියෙන් පසු සේවා ලබා දීම සඳහාම වෙන්වූ නවීන සේවා මධ්‍යස්ථාන හයක් Sterling Aftercare Centre නමින් නුගේගොඩ, කඩවත, නාරාහේන්පිට, රත්මලාන, මිනුවන්ගොඩ සහ ගාල්ල යන නගරවල පිහිටා තිබෙනවා. මෝටර් රථ සඳහා වගකීම් සහතිකයක් සහිතව තමන් විසින්ම පවත්වාගෙන යන සේවා මධ්‍යස්ථාන තිබෙන ශ්‍රී ලංකාවේ එකම ආයතනය ස්ටර්ලින් ජැපෑන් සමාගමට අනුබද්ධිත ස්ටර්ලින් ඔටෝමොබයිල්ස් ලංකා (පුද්.) සමාගමයි. මේ නිසා වගකීමක් හෝ ප්‍රමිතියක් නොමැති මෝටර් රථ අලුත්වැඩියා ස්ථාන කරා යාමට අවශ්‍ය වන්නේ නෑ.

නව තාක්ෂණයෙන් පරිපූර්ණ වූ මෙම සේවා මධ්‍යස්ථාන තුළින් පාරිභෝගිකයෙකුට තමන්ගේ වාහනයට අවශ්‍ය ඕනෑම සේවාවක් ඉතා කාර්යක්ෂම සහ දක්ෂ කාර්යමණ්ඩලයක් හරහා ලබා ගැනීමට පුළුවන්. එපමණක් නොවෙයි, රථය හදිස්සියේ ක්‍රියාවිරහිත වූ අවස්ථාවකදී ඔබේ සහයට පැය 24 පුර ක්‍රියාත්මක වෙන රෝඩ්සයිඩ් ඇසිස්ටන්ස් සේවාවක්ද අප ස්ථාපිත කර තිබෙන්නේ ස්ටර්ලින්හි වගකීම යටතේ මෝටර් රථයක් මිලදී ගත් ඔබට ඉතා විශිෂ්ට සේවාවක් ලබා දීමටයි.

ඉතින් නැවත අලෙවි කිරීමේදී Sterling Aftercare Guarantee වගකීම් සහතිකය සහිත රථවලට වෙළඳපොළේ වැඩි වටිනාකමක් ලැබෙන්නේ, ඒවා තත්ත්වයෙන් උසස්වීම සහ එම වාහනවල නඩත්තු වාර්තා Sterling Aftercare මධ්‍යස්ථාන හරහා ලබා ගත හැකි වීම නිසයි. මේ හරහා පාරිභෝගිකයින්හට තත්ත්වයෙන් උසස් රථයක් දැරිය හැකි මිලකට මිලදී ගැනීමට අවස්ථාව උදාවෙනවා පමණක් නොවෙයි, එම මෝටර් රථය නැවත අලෙවි කිරීමේදී ඉතා හොඳ අගයක් ලබා ගැනීමට හැකි වෙනවා.




STERLING
AFTERCARE CENTRE
STERLING AFTER CARE GUARANTEE










ජයග්‍රාහී 06 වන ශාඛාව මාලිගාව පාර, රත්මලානේදී විවෘත වන වගයි.

0117 600 800 www.sterling.lk